# ACCOUNTING RATIO ANALYSIS
# (Part - III)

***S. Madushanka***
***B.Sc (Mgt) Accounting (Special) (U.G)***
***University of Sri Jayewardenepura***

# ආයෝජන අනුපාත

කොටස් හිමියන් යෙදවූ කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් සමාගම උපයන ලද ලාභය හා බෙදා හරින ලද ලාභය මැන බැලීමට ගණනය කරන අනුපාත ආයෝජන අනුපාත ලෙස හැඳින්වේ.

## කොටසක ඉපැයුම

සමාගමේ එක් සාමාන්‍ය කොටසක ඉපැයුම ගණනය කිරීම සඳහා මෙම අනුපාතය භාවිතා කරයි.

$$\text{කොටසක ඉපැයුම} = \frac{\text{සාමාන්‍ය කොටස් සඳහා බෙදීමට ඇති කාලච්ඡේදයේ ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

## කොටසක ලාභාංශ

සමාගමේ එක් සාමාන්‍ය කොටසකට ලාභාංශ වශයෙන් රුපියල් කීයක් ලැබෙන්නේද යන්න ගණනය කිරීම සඳහා මෙය භාවිතා කරයි.

$$\text{කොටසක ලාභාංශ} = \frac{\text{සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

Class World

<u>අභ්‍යාස - 01</u>

2022. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත.

(රු.000)

| | සා. කොටස් ප්‍රාග්ධනය | පොදු සංචිත | රඳවාගත් ලාභය |
|---|---|---|---|
| 2021. 04. 01 ශේෂය | 10 000 | 2 000 | 1 000 |
| කාලච්ඡේදයේ ලාභය | - | - | 4 000 |
| පොදු සංචිතය | - | - | (500) |
| ගෙවූ ලාභාංශ | - | - | 10 000 |
| 2022. 03. 31 ශේෂය | 10 000 | 2 000 | 3 500 |

2022. 03. 31 දිනට සාමාන්‍ය කොටසක ප්‍රතිෂ්ඨාව රු. 20/- කි.

(1) සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට 2022 වර්ෂයේ කොතරම් ලාභ බෙදා දීමට හැකි ද?

(2) අතුරු ලාභාංශ වශයෙන් කොතරම් ප්‍රමාණයක් වර්ෂය තුළ ගෙවා ඇත්ද?

(3) සමාගමේ සාමාන්‍ය කොටස් ගණන කවරේද?

(4) සාමාන්‍ය කොටස් සඳහා බෙදීමට ඇති ලාභය සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් කොටසක ඉපයුම ගණනය කරන බව පෙන්වන්න.

(5) වර්ෂය තුළ සාමාන්‍ය කොටස් හිමියන්ට බෙදා දී ඇති ලාභය සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් කොටසක ඉපයුම ගණනය කරන බව පෙන්වන්න.

ClassWork.LK

<u>අභ්‍යාසය - 02</u>

(1) ආයෝජන අනුපාත මගින් ව්‍යවසායකයකුට ලබා ගත හැකි ප්‍රයෝජන දක්වන්න.

(2) කොටසක ලාභාංශ ගණනය කරන ආකාරය දක්වන්න.

(3) සමාන ස්වභාවයේ සමාගම් දෙකක ගිණුම්කරණ අනුපාත ඇසුරෙන් පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

| | **A සමාගම** | **B සමාගම** |
|---|---|---|
| කොටසක ඉපයුම(රු.) | 4.75 | 18.25 |
| කොටසක ලාභාංශ (රු.) | 10.50 | 10.50 |

මුදල් ආයෝජනය කිරීමට වඩාත් සුදුසු සමාගම දක්වන්න.

ClassWork.Lk

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura